# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1993/29 - 2016 නොවැම්බර් මස 18 වැනි සිකුරාදා - 2016.11.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක : IR/10/43/2012

**කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.04.17 දිනැති හා අංක 1858/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2014.04.01 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මතුගම, අළුත්ගම පාර, අංක 392/11 හි පදිංචි බී. එච්. ඒ. සිරිල් ගුණරත්න මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 50 හි පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2016.06.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 නොවැම්බර් මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංක : IR/10/43/2012

කාර්මික අධිකරණයේ දී ය.

බී. එච්. ඒ. සිරිල් ගුණරත්න,
නො. 392/11, අළුත්ගම පාර,
මතුගම.

නඩු අංකය : ඒ - 3546 සහ

ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

**ප්‍රදානය**

කම්කරු හා කම්කරු සබඳතා ඇමති වන ගාමිණී ලොකුගේ මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව,

එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා ඔහුගේ 2014.04.01 දිනැති නියෝගයෙන් මා පත්කර ඇත.

දෙපාර්ශ්වය අතර පවත්නා කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ ලංකා විදුලි බල මණ්ඩලයේ සේවකයෙකු වන බී. එච්. ඒ. සිරිල් ගුණරත්න නැමැති අයට ඔහුගේ වැඩ තහනම් කර සිටි කාලය වන 2002.04.09 දින සිට 2008.02.26 දක්වා කාලයට ඔහුට යම් හිඟ වැටුපක් හිමි වනනේ ද? එසේ හිමි වන්නේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

දෙපාර්ශ්වය විසින් ඔවුන්ගේ ප්‍රකාශ බේරුම්කරණයට ඉදිරිපත් කිරීමෙන් පසු එකිනෙකාගේ ප්‍රකාශ හුවමාරු කිරීමෙන් ද පසුව වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ සුජිත් පෙරේරා මහතා සමග නීතිඥ ක්‍රිෂාන්ති සමරවීර, නීතිඥ අචිනි වික්‍රමසිංහ යන නීතිඥවරියන් ද ආයතනය වෙනුවෙන් මානව සම්පත් නිලධාරි මංජුල රත්නායක පෙනී සිටින ලදී. ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් ආරම්භයේ සිට නීතිඥ එස්. ටී. ගුණවර්ධන මහතා පෙනී සිටි අතර අවසාන අවස්ථාවේ දී ඉල්ලුම්කරුගේ නියෝජිත ලෙස ග්‍රේෂන් සිල්වා මහතා පෙනී සිටින ලදී.

දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි ලිඛිත දේශන හා ලේඛන විශ්ලේෂණය කිරීමෙන් පසු පහත සඳහන් කරුණු අනාවරණය විය.

1 A – G 24575 — 21 (2016/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. ඉල්ලුම්කරු 1979.05.10 වන දින සේවයට බැඳී ඇති අතර 2002.04.08 වන දින දක්වා අඛණ්ඩව විවිධ ස්ථානවල සේවය කර ඇත.

2. 2002.04.08 වන දින රු.65900/-ක මුදලක් අල්ලස් ගැනීම යන චෝදනාව මත 2002.04.22 දිනැති ලිපියෙන් 2002.04.09 වන දින සිට වැඩ තහනම් කර 2008.02.26 වන දින නැවත සේවයට කැඳවා ඇත.

3. ඉල්ලුම්කරුට විරුද්ධව අල්ලස් කොමිසම විසින් මහාධිකරණයේ පවරණ ලද නඩුව පැමිණිලිකරු නොපැමිණීම මත 2005.11.05 වන දින අස් කරගෙන ඇත. නැවත අවශ්‍ය වුවහොත් නඩුවක් පැවරීමේ අයිතිය තබාගෙන මෙම නඩුවේ ඉල්ලුම්කාර සිරිල් ගුණරත්න නිදහස් කර ඇත.

4. අල්ලස් නඩුව මහාධිකරණයෙන් ඉල්ලා අස් කරගෙන නිදහස් කර ඇති බව 2006.11.30 දිනැති ලිපියකින් විදුලිබල මණ්ඩලයට දන්වා ඇති බව තහවුරු කරමින් අල්ලස් කොමිසම 2014.06.24 වන දිනැති ලිපියක් මගින් ඉල්ලුම්කරුට දන්වා ඇති බව X 20 හා X 21 ලේඛනවලින් තහවුරු කර ඇත.

5. 2006.11.03 ලිපියෙන් අල්ලස් කොමිසම නඩුව ඉල්ලා අස් කර ගත් බව විදුලිබල මණ්ඩලයට දන්වා තිබිය දීත් එම කරුණ සම්බන්ධව විදුලිබල මණ්ඩලය චෝදනා පහක් ඉදිරිපත් කර ඇත්තේ 2007.07.25 වන දින දී ය.

6. එම චෝදනා 5 න් 1, 3, 4 චෝදනාවලට නිවැරදිකරු කර ඇත. දෙවන චෝදනාව අල්ලස් ගැනීමේ දී අත් අඩංගුවට ගැනීම වරදකරු කර එය විදුලිබල මණ්ඩලයේ සාක්ෂිකරුවන්ගේම සාක්ෂිවලින් ගැටලු සහගත බවක් පෙන්වයි. චෝදනා එල්ල කළ පමණින් කෙනෙකු වරදකරු කළ නොහැක. එය කරුණු සහිතව සනාථ කළ යුතුව ඇත. අල්ලස් ගත් බවට අභ්‍යන්තර වාර්තාව අනුව පැහැදිලි නොවේ. සාක්ෂි පරස්පර බව පැහැදිලිය. මුදල් ඉල්ලනවා හෝ ගන්නවා දුටු බවට සාක්ෂි නැත. ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් 2014.12.05 කියා ඇත්තේ මම ඇහැව්වා ඇයි මුදල් කියා. ඔයා ඉල්ලූ ඒවා තමයි කියා කීවා. ඊට පසු අපි විවාද වන විට මහත්තයෙක් ඇවිත් කිව්වා නැහැ ඔයා සල්ලි ඉල්ලුවා ඒ සල්ලි තමයි ඔය දීල තිබෙන්නේ කියලා මට තර්ජනය කරලා මාව අල්ලා ගත්තා. 2015.12.20 දින සාක්ෂියත් ද තහවුරු වන්නේ මුදල් මේසය මත තැබූ බවයි. මුදල් ගත් බවට බාහිර සාක්ෂිවලින් තහවුරු වී නැත.

7. මහාධිකරණයෙන් නිදහස් වූ පසු කිහිප අවස්ථාවක ඉල්ලුම්කරු නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා ඇතත් එය ඉටු නොවන නිසා කළුතර කම්කරු විනිශ්චය සභාවේ නඩුවක් පවරා ඇත. එහි දී විදුලිබල මණ්ඩලය වෙනුවෙන් 2008.02.26 දින රජයේ නීතිඥවරිය පවසා ඇත්තේ ඉල්ලුම්කරු නැවත සේවයේ පිහිටුවීමට තීරණය කර ඇති බවයි. එම අවස්ථාවේ ඉල්ලුම්කරුගේ නියෝජිත ඉල්ලුම්කරුට හිඟ වැටුප් ගෙවීම සම්බන්ධයෙන් වගඋත්තරකරු සමග (ලංකා විදුලිබල මණ්ඩලය සමග) සාකච්ඡා කොට තීරණයක් ගැනීමේ අයිතියට යටත්ව සේවය කඩ වීමකින් තොරව සේවයට වාර්තා කිරීමට එකඟ වී ඇත. ඒ අනුව ඉල්ලුම්පත ඉවත් කරගෙන ඇත. නමුත් ඒ පිළිබඳව විටින් විට ඉල්ලීම් කලත් ඉටු නොවූ තැන කාර්මික ආරවුල් පනතේ පිහිට පතා ඇති බව පැහැදිලිය.

8. සේවය නැවත පිහිටුවීමට 2008.02.18 ලිපිය නිකුත් කළත් එය කම්කරු විනිශ්චය සභා දිනයට පෙර (2008.12.26 දිනට පෙර) ඉල්ලුම්කරුට ලැබූ බවට සනාථ කිරීමට බැරි වී ඇත. ඉල්ලුම්කරු නැවත සේවයට වාර්තා කළ දින හෝ සේවයේ පිහිටුවීමට කැඳ වූ ලිපියේ ලියාපදිංචි තැපැල් කුවිතාන්සිය හෝ ඉදිරිපත් කිරීමට වගඋත්තරකරුට නොහැකි වී ඇත. නැවත සේවයේ පිහිටුවන බවට වූ ලිපිය කම්කරු විනිශ්චය සභා නඩු දිනයට පෙර ලැබුණා නම් සමථ කොන්දේසි වෙනස් වීමට ඉඩ තිබුණි. එසේම හිඟ වැටුප් නොගෙවන්නේ නම් විදුලිබල මණ්ඩලය ඒ බව එම අවස්ථාවේම කම්කරු විනිශ්චය සභාවට දැන්විය යුතුව තිබුණි.

9. විදුලිබල මණ්ඩලයට විනය නීති මාලාවක් ඇත. එය ආර් 6 ලෙස ඉදිරිපත් විය. එය 6 a මගින් දන්වන්නේ විනයානුකූල කෘත්‍යයේ ප්‍රතිඵලය ලෙස යම් සේවකයෙකුට නගා ඇති චෝදනාවලින් ඔහු නිදොස් කරනු ලැබුවහොත් එම සේවකයා නැවත සේවයේ පිහිටුවනු ලැබීමෙන් පසුව ඔහුගේ තනතුරේ කාර්යයන් නැවත ආරම්භ කිරීමත් සමග අත්හිටවූ වැටුප ඔහුට හිමි විය යුතු බවය. මෙම පුද්ගලයාගේ වැඩ තහනමට මූලික හේතුව වූයේ අල්ලස් ගැනීම නැමැති චෝදනාව නම් එයින් ඔහු නිදහස්ව ඇත් නම් ඔහුට ඔහුගේ අත්හිටවූ වැටුප ගෙවිය යුතු ය. අල්ලස් ගැනීම පිළිබඳව ඔප්පු කිරීමක් නොමැතිව නඩුව ඉල්ලා අස් කරගෙන ද ඇත. එසේ නම් මණ්ඩලය මගින් නගන චෝදනා වලින් ද ඉල්ලුම්කරු අනිවාර්යෙන්ම නිදහස් විය යුතු ය.

10. වග උත්තරකරුගේ R 6 ලේඛනයේ (ඉල්ලුම්කරු එය X 22 ලෙස ලකුණු කර ඇත.) අනුව ක්‍රියා නොකර සාමාන්‍යාධිකාරිවරයාට සිතැඟි ලෙස ක්‍රියා කර ඇත. මීට පෙර හිඟ වැටුප් ගෙවා නැති ද යන්න පිළිබඳ ඉදිරිපත් වූ කරුණු සහ වග උත්තරකරුගේ සාක්ෂිකාරියට ද මීට පෙර එවැන්නක් සිදු වී නැති බවට සහතික වීමට නොහැකි යයි ප්‍රකාශ වීම මතම මීට පෙර සේවයේ පිහිට වූ පුද්ගලයින්ට අත්හිටුවා තිබූ වැටුප් ගෙවා ඇති බව වක්‍රව සනාථ කරයි.

11. ඉහත හෙළි වූ කරුණු සියල්ල සාක්ෂි සහ ලේඛන මගින් සනාථ කර ඇති බැවින් ඉල්ලුම්කරු ඔහුගේ වැඩ තහනම් කළ කාලයට (එනම් 2002.04.09 දින සිට 2008.02.26 දක්වා) හිඟ වැටුප් ගෙවීම යුක්ති සහගත බව තීරණය කරමි.

එම නිසා ඉල්ලුම්කරුට හිඟ වැටුප් ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගෙවිය යුතු බවත් මෙම තීරණය ගැසට් කිරීමෙන් පසු මසක් ඇතුළත ගෙවීම් නිම කිරීමට නියෝග කරමි. ඉල්ලුම්කරු දැනට සේවයේ නියුතු බැවින් මෙම ගෙවීම ආයතනය තුළ ගෙවීම් පරිපාටියකට අනුව කිරීමටද නියෝග කරමි.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත බව මගේ නිගමන යයි.

ආර්. එස්. ආරියප්පෙරුම,
බේරුම්කරු,

2016 ජුනි මස 20 දින දී ය.

12 - 145

මගේ අංක : IR/10/49/2013(1)

## කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2015.07.02 දිනැති හා අංක 1921/56 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2015.06.24 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් දෙහිවල, කවුඩාන, අබේසේකර පාර, අංක 118/ඒ හි පදිංචි වී. එස්. සී. විතානගේ මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 04, ඩික්මන් පාර, ස්ටබ් පෙදෙස, අංක 35/1 හි පිහිටි සෙලින්කෝ කෝපරේෂන් ලිමිටඩ් හා කොළඹ 08, අල්විස් ඇවනිව්, කාසල් වීදිය, අංක 174/3 හි පිහිටි සෙලින්කෝ කැපිටල් ඉන්වෙස්ට්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2016.08.15 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 නොවැම්බර් මස 06 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/10/49/2013(1)

කාර්මික අධිකරණයේ දී ය.

වී. එස්. සී. විතානගේ මිය,
නො. 118/ඒ, අබේසේකර පාර,
කවුඩාන,
දෙහිවල.

නඩු අංකය ඃ ඒ - 3606 සහ

(1) සෙලින්කෝ ලීසිං කෝපරේෂන් ලිමිටඩ්,
අංක 35/1, ස්ටබ් පෙදෙස,
ඩික්මන් පාර,
කොළඹ 04.

(2) සෙලින්කෝ කැපිටල් ඉන්වෙස්ට්මන්ට් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්,
නො. 174/3, කාසල් වීදිය,
අල්විස් ඇවනිව්,
කොළඹ 08.

### ප්‍රදානය

කම්කරු ඇමති වන එස්. බී. නාවින්න මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා ඔහුගේ 2015.06.24 නියෝගයෙන් මා පත්කර ඇත.

දෙපාර්ශ්වය අතර පවත්නා කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ ''සෙලින්කෝ ලීසිං කෝපරේෂන් ලිමිටඩ්, සෙලිංකෝ කැපිටල් ඉන්වෙස්ට්මන්ට් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනවල සේවය කළ වී. එස්. සී. විතානගේ මිය ගේ සේවය 2009 ජූනි මස සිට අවසන් කිරීම සම්බන්ධයෙන් වන්දි මුදල් සහ පාරිතෝෂික මුදල් ලබා දෙන ලෙස කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත ද යන්න සහ එලෙස යුක්ති සහගත වන්නේ නම් ඇයට හිමි විය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.'' දෙපාර්ශ්වය විසින් ඔවුන්ගේ ප්‍රකාශ හුවමාරු කර ගැනීමෙන් පසු 2016.02.18 වන දින ඉල්ලුම්කාරිය වෙනුවෙන් නීතිඥ ජීවන් ගුණතිලක මහතා පෙනී සිටිය දී පළමු පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ ජාවික් මන්සූර් මහතා පෙනී සිටින ලදී. දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ එන්. එම්. සාහිඩ් මහතා මූලික විරෝධතාවයක් ඉදිරිපත් කළ අතර පළමු වගඋත්තරකාර පාර්ශ්වයේ නීතිඥ මහතා කියා සිටියේ අවසන් වරට එනම් 2009 යේ ජූනි මස සේවය අවසන් කරනු ලබන අවස්ථාවේ සේවයේ යෙදී සිටියේ කුමන සමාගමේ ද යන්න මූලික තීරණයක් දෙන ලෙස ය.

ඉල්ලුම්කාර පාර්ශ්වයේ නීතිඥ මහතා පෙන්වා දුන්නේ සේවය අවසන් කරන අවස්ථාවේ කොයි ආයතනයේ සේවය කළාද යන්න තීරණය කළ හැකි වන්නේ සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසුව බවයි.

පෙත්සම්කාරියගේ මූලික සාක්ෂි ආරම්භ කරන ලද අතර ඇයගේ සාක්ෂි අවසානයේ පළමු වගඋත්තරකාර පාර්ශ්වයෙන් හරස් ප්‍රශ්න අසන ලද අතර දෙවන පාර්ශ්වයට හරස් ප්‍රශ්න ඇසීමට දින ලබා දෙන ලදී.

2016.06.06 වන දින දෙවන පාර්ශ්වය ඉල්ලුම්කාරියගෙන් හරස් ප්‍රශ්න ඇසීමට නියමිතව තිබුණත් ඉල්ලුම්කාර පාර්ශ්වයේ ඉල්ලීම මත වගඋත්තරකාර පාර්ශ්වයත් සමථයකට එකඟතාවය පළ කරන ලදී.

2016.07.29 වන දින පළමු හා දෙවන පාර්ශ්වයන්ගේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත සමාගම් දෙක වෙනුවෙන් නීතිඥ මධුභාෂිණී රාජපක්ෂ මහත්මිය පෙනී සිට ඉල්ලුම්කාර පාර්ශ්වයට රුපියල් එක්ලක්ෂ දහනව දහස් විසි පහක (රු. 119025.00) ඉල්ලුම්කාරියගේ එකගත්වය මත ගෙවන ලදී. එම මුදල් ලබා ගත් බවට ඉල්ලුම්කාරිය විසින් රිසිට්පතක් වගඋත්තරකාර සමාගම් වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහත්මියට ලබා දී එහි පිටපතක් නඩු ගොනුවට ගොනු කර නඩුව සමථයකට පත් කරන ලදී.

ආර්. එස්. අරියප්පෙරුම,
බේරුම්කරු,

2016 අගෝස්තු මස 15 දින දී ය.

12 - 146

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.